පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සබරගමුව සති පාසල

විෂය:- **පෙරදිග සංගීතය**

සතිය :- 04

ශ්‍රේණිය :- 10

Prepared by - **දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

Department of Education, Sabaragamuwa Province/ Weekly School

# ඒ.ආර්.රහමාන් මහතා.

**ඒ.ආර්.රහමන්**



වර්ෂ 1967 ජනවාරි මස 06 වන දින තමිල්නාඩුවේ චෙන්නායිහි දී උපත ලද අල්ලා රක්හා රහමන්ගේ මුල් නම 'A.S දිලීප් කුමාර්' විය. දෙමළ සහ මලයාලම් චිත්‍රපට සඳහා සංගීතය නිර්මාණය කළ ප්‍රකට සංගීතඥයකු වූ R.K ශේකර් නම් සංගීතඥයා මොහුගේ පියා වූ අතර මව කරීමා නම් විය. පියාගේ සංගීත ආභාසය මොහුට ලැබුණු අතර තම පියාගේ ශබ්දාගාරයේ දී Keyboard වාදකයකු ලෙස තම පියාට දායකත්වය ලබා දී ඇත. මොහුට වයස අවුරුදු 9ක් වන විට ඔහුගේ පියා මිය ගියේ ය. පියාගේ සංගීත උපකරණ කුලියට දී ලැබෙන මුදල පවුලේ ආදායම බවට පත්විය. ඔහුට වයස අවුරුදු 11 දී පමණ මාස්ටර් ධන්රාජ් නම් සංගීතඥයා යටතේ සංගීතය හැදෑරීම ආරම්භ කළ අතර M. K. අර්ජුනන් සංගීතඥයාගේ සංගීත කණ්ඩායමේ වාදකයකු ලෙස ද කටයුතු කළේ ය. මොහු ඉතා කෙටි කලක දී ම සංගීත නිර්මාණකරුවකු ලෙස පළපුරුදු සංගීතඥයන් සමඟ කටයුතු කිරීම ඇරඹී ය. වයස අවුරුදු 23 දී පමණ ඔහු තම මවගේ ආගම වන ඉස්ලාම් ආගම වැලඳගත් අතර තම නම ද ''අල්ලාරක්හා රහමන්'' ලෙස වෙනස් කර ගත්තේ ය.

රහමාන් ගීත රචකයකු, සංගීත නිර්මාණකරුවකු, සංගීත නිෂ්පාදකවරයකු සහ සංගීතඥයකු ලෙස කටයුතු කොට තිබේ. එසේ ම ලොව අග්‍රගණ්‍ය චිත්‍රපට සංගීත නිර්මාණකරුවකු ලෙස නමක් දිනා ගත්තේ ය. ඔහුගේ සංගීත නිර්මාණ පෙරදිග ශාස්ත්‍රීය සංගීතය ඉලෙක්ට්‍රොනික සංගීතය සමග සංකලනයෙන් නිර්මාණය වී ඇත. චෙන්නායිහි ඔහුගේ නිවසේ ඇති "පංචතන් රෙකෝඩ් ඉන්" (Panchathan Record Inn) ආයතනය ආසියාවේ ඇති ඉහළ ම තාක්ෂණයෙන් යුත් ශබ්දාගාරයකි. 1990 දශකයේ දී "රෝජා" නම් දමිළ චිත්‍රපටයෙන් චිත්‍රපට පසුබිම් සංගීත නිර්මාණය ආරම්භ කරමින් අන්තර්ජාතික සිනමා ක්ෂේත්‍රයට පිවිසියේ ය. ඔහු ලොව සිටින හොඳ ම පටිගත කිරීමේ ශිල්පියෙකි (Recording Artist). ඔහු පටිගත කළ නිර්මාණ සෑම විට ම ලොව පුරා වැඩියෙන් ම අලෙවි වන නිර්මාණ බවට පත් ව ඇත. ඔහු චිත්‍රපට රාශියක සාර්ථකත්වයට සංගීතයෙන් දායක වී ඇති අතර චිත්‍රපට ක්ෂේත්‍රයේ වැඩි ම මුදලක් අය කරන නිර්මාණකරු බවට ද පත් ව ඇත. චිත්‍රපට ක්ෂේත්‍රයට අමතර ව විවිධ සංගීතමය කටයුතුවලට දායක වී ඇත. ඔහු රූපවාහිනිය, කෙටි නාට්‍ය, වාර්තාකරණ, වැඩසටහන් රාශියකට සංගීත නිර්මාණකරණයෙන් දායක වී ඇත. වාද්‍ය වෘන්ද රාශියක් ද නිර්මාණය කර ඇත.

ගායනයට මෙන් ම ගිටාර්. Percussion (තැළීමෙන් නාද නිපදවන භාණ්ඩ) ඩ්‍රම්ස්. ස්වර පුවරු. පියානෝ. එකෝඩියන්, ගොම්ලෙට් ඩ්‍රම්ස්, ආදී භාණ්ඩ රාශියක් වාදනයට ද හැකියාව ඇති ශිල්පියෙකි. මානව හිතවාදියකු මෙන් ම පරිත්‍යාගශීලියකු ලෙස ද ප්‍රකට ය.
ඔහු සංගීත ක්ෂේත්‍රයට දැක්වූ දායකත්වය වෙනුවෙන් ජාතික සහ අන්තර්ජාතික මට්ටමේ සම්මාන රාශියකින් පිදුම් ලැබූ අතර විශ්ව විද්‍යාල කිහිපයකින් ම ද ආචාර්ය උපාධි පිරිනමා ඇත.

- National Film Awards - (සිවු වරක් දිනා ඇත)
- Tamil Nadu State Film Awards
- Filmfare Awards - (13 වරක් දිනා ඇත)
- Musical Achievement Awards
- Padma Shri Awards
- Academy Awards
- Golden Globe Awards
- I I F A Awards

මේ ඔහු දිනූ සම්මාන අතරින් කිහිපයකි. එමෙන් ම ඔහු ඉන්දියානු චිත්‍රපට ක්ෂේත්‍රයට කීර්තිමත් ශිෂ්‍ය පරම්පරාවක් දායාද කොට ඇති අතර ප්‍රසිද්ධ සංගීත රචකයෝ, නිර්මාණකරුවෝ, සංගීත අධ්‍යක්ෂවරු රැසක් ඒ අතර වෙති.

---

**ඒ.ආර්.රහමාන් මහතා පිළිබඳ ව ඊ නැණ පියසේ 10 වසර සාමාන්‍ය පාඩම් වෙත යොමු වන්න. අන්තර්ජාලයේ මෙතුමා පිළිබඳ තොරතුරු රැසක් හා නිර්මාණ රැසක් පවතින අතර ඒවා නරඹා අවබෝධ කරගන්න. පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**ක්‍රියාකාරකම**

1. **ඒ.ආර්.රහමාන් මහතා දක්ෂතා දක්වන ක්ෂේත්‍ර 3ක් නම් කරන්න**
2. **මෙතුමාගේ ශබ්දාගාරයේ නම කුමක්ද ?**
3. **මෙතුමා අන්තර්ජාතික සිනමා කෂේත්‍රය ට පිවිසුනේ කුමන චිත්‍රපටයේ පසුබිම් සංගීත නිරිමාණයෙන්ද?**
4. **මොහු වැයීමට දක්ෂ සංගීත භාණ්ඩ 3ක් නම් කරන්න.**
5. **ඒ.ආර්.රහමාන් මහතා දිනාගත් සම්මාන 3ක් නම් කරන්න.**